# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
## முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
## DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01

நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
செயலகம், கொழும்பு 01

Ministry of Finance, Economy and Policy Development
The Secretariat, Colombo 01


මගේ අංකය / எனது இல / My No: DMA/AMC/M/2020/5-4

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2020.06.02

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම් වරුන්

**<u>2020 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම</u>**

2019.01.12 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01-2019 හි 5.3 ඡේදය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක්, එනම් වර්ෂයකට 04ක් වන පරිදි පැවැත්විය යුතු වේ. එසේ උවද, ගෝලීය covid -19 වසංගතය නිසා රට තුල ඇතිවූ තත්වය හේතුවෙන් බොහෝ ආයතන සැලසුම් කල පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වී ඇති බව දැනගන්නට ඇත.

එබැවින් මෙම ලිපිය මගින් කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01-2019 හි ඡේද අංක 5.3 ප්‍රකාරව 2020 වර්ෂයේදී කාර්තුවකට එක බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරණු ලැබේ. එහෙත් තුන්වන හා හතරවන කාර්තු වල පැවැත්වීමට නියමිත විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි සෞඛ්‍ය ක්‍රමවේද අනුගමනය කරමින් එම උපදෙස් වලට අනුකූලව පැවැත්වීම සඳහා කටයුතු සංවිධානය කර ගැනීම සුදුසු බවත්, මෙම වර්ෂය තුල පැවැත්වීමට නොහැකි වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වල දී සාකච්ඡා කිරීමට සැලසුම් කරන ලද වැදගත් කරුණු ද ඉදිරි රැස්වීම් වලදී සාකච්ඡා කොට අවශ්‍ය තීරන ගනු ඇතැයි ගෞරවයෙන් අපේක්ෂා කරමි.

එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:- විගණකාධිපති (දැ.ගැ. පි.)


කාර්යාලය / அலுவலகம் / Office 2484816 2484500 2484600 2484700

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General (9411) 2484543

ෆැක්ස් / பெக்ஸ் / Fax 2449496

වෙබ් අඩවිය / வெப் சைட் / website www.treasury.gov.lk